**කුරුණෑගල මහා නගර සභාව - 2021**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 ව්‍යාවනය කළ මතය

**---------------------**

කුරුණෑගල මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කුරුණෑගල මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

**------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළ කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**---------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

**--------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

  - අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

  - භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ, ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
  - මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති,වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් ශීර්ෂ 50323 යටතේ දැක්විය යුතු වාර්ෂික කඩ කාමර කුලී බිල් කිරීම් රු.10,817,988 ක් වුවද ආදායම් වියදම් ගිණුමේ සෘණ අගයක් වූ (රු.89,772,914) ක් දක්වා තිබීම හේතුවෙන් ආදායම රු.100,590,902 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ වැටුප් ප්‍රතිපූර්ණය රු.230,546,883 ක් වුවද රු.189,037,082 ක් ලෙස දක්වා තිබීමෙන් වියදම රු.41,509,801ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.110,506,203 ක් ලෙස හදුනාගෙන ඇතත් ආදායම් වියදම් ගිණුමේ රු.14,968,700 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් රු.95,537,503 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.4,424,725 ක් වුවත්, සෘණ රු.2,229,075 ක් ආදායම් වියදම් ගිණුමේ දැක්වීමෙන් ආදායම හා සමුච්චිත අරමුදල රු.6,653,800 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඉ) | සභාව සතු රු.1,948,545 ක් වටිනා ටැබ් යන්ත්‍ර 60 ක් ගිණුම් වලින් අත්හැරීම හේතුවෙන් කාර්යාල උපකරණ ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අඩුවෙන් දක්වා තිබුණි. | | |

<table>
<tr><td>(ඊ)</td><td>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෝටර් රථ හා කරත්තවල වටිනාකම රු.213,038,000ක් වුවත්, රු.251,621,712 ක් දක්වා තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.38,583,712 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.</td><td rowspan="4">2022 වර්ෂයේ දී නිවැරදි කරන බව දන්වමි.</td><td rowspan="4">නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ.</td></tr>
<tr><td>(උ)</td><td>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු සැපයුම් ණයහිමියෝ රු.57,133,992 ක් වුවද රු.39,349,168ක් ලෙස රු.17,784,824 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.</td></tr>
<tr><td>(ඌ)</td><td>සමාලෝචිත වර්ෂයේ දී පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ඉදිකිරීම් 02 ක් සඳහා ලැබී තිබූ රු.21,692,847 ක ආධාර මුදල මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වියදම් යටතේ සහ ණයගැති හා ණයහිමි ලෙස දක්වා නොතිබුණි.</td></tr>
<tr><td>(එ)</td><td>සමාලෝචිත වර්ෂයට අදාළව ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු පොළිය රු.4,206,376 ක් වුවත් එය රු.11,209,116 ක් ලෙස රු.7,002,740ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීමෙන් ආදායම හා ලැබිය යුතු ආදායම වැඩියෙන් දක්වා තිබුණි.</td></tr>
<tr><td>(ඒ)</td><td>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සුන්දරාපොළ කසළ අංගනයේ පැවති රු.4,357,008ක් වටිනා පොහොර මළු තොගය ගිණුම්ගත කර නොතිබුණි.</td><td>2021 දෙසැම්බර් 31 දිනට අවසන් තොග ලෙස දක්වා නොමැති බව සඳහන් කරමි.</td><td>සභාවේ විවිධ ඒකකවල පවතින තොග ගිණුම්ගත කළ යුතු වේ.</td></tr>
<tr><td>(ඔ)</td><td>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින සුන්දරාපොළ කසළ අංගනයේ පැවති රු.3,430,000 වටිනා වූ පොහොර ටොන් 343ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.</td><td>සුන්දරාපොල පොහොර නිෂ්පාදන ඒකකය වෙනම ගිණුම් ඒකකයක් ලෙස සලකා ගිණුම් තැබීමේ අවශ්‍යතාවය පවතී. එබැවින් ඉදිරියේ දී එම ගිණුම් ක්‍රමවේදය ආරම්භ කරන බව සඳහන් කරමි.</td><td>නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ.</td></tr>
<tr><td>(ඕ)</td><td>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව විසින් බාහිර පාර්ශවයන් 19 කට නඩු පවරා තිබූ අතර, සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් 07 දෙනෙක් නඩු පවරා තිබුණ ද, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.</td><td>විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි මෙම අසම්භාව්‍ය බැරකම් ඉදිරි මූල්‍ය ප්‍රකාශනයේ දී හෙළිදරව් කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි.</td><td>නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| (ක) | සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැගිලි 08 ක් ඉදිකිරීම සඳහා දරා තිබූ රු.123,472,733 ක මුදල ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ඉදිරි වර්ෂයේ දී වත්කම් ප්‍රාග්ධනිත කිරීම සඳහා කටයුතු කරන බව සඳහන් කරමි. | ගොඩනැගිලි සංවර්ධන වියදම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. |

## 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.99,325,800 ක් වූ ආදායම් වෙනුවෙන් තැම්පත්, ටෙන්ඩර්, ජල සේවා, මිශ්‍ර තැම්පත් හා විවිධ තැන්පත් යන ගිණුම් විෂයයන් 05 ට අදාළ ශේෂය හා උපලේඛනවල දැක්වෙන ශේෂය අතර රු.236,254,053 ක වෙනසක් විය. | විගණනයෙන් පෙන්වා දී ඇති ගිණුම් විෂයයන්ට අදාල නිවැරදි උපලේඛන කඩිනමින් සකස් කර විගණනයට ඉදිරිපත් කර අදාල ගිණුම් නිවැරදි කිරීම සඳහා කටයුතු කරන බව දන්වමි. | නොසැසඳීමට හේතු පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.3,545,662,131ක් වූ වත්කම්, ආදායම්, තොග හා වගකීම් යන ගිණුම් විෂයයන් 22 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | 2022 වර්ෂය තුල උපලේඛන සකස් කර කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කරන බව සඳහන් කරමි. | ගිණුම් ශේෂයන් හා ගනුදෙනු තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත්, උචිත සාක්ෂින් විගණනයට ලබාදීමට කටයුතු කළ යුතුවේ. |

## 1.6.4 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජපිහිල්ල තානායමෙන් 2007 වර්ෂයේ සිට 2019 දක්වා අයවිය යුතු රු.5,934,935 ක මුදල විධිමත් අනුමැතියකින් තොරව ගිණුම් වලින් ඉවත්කර තිබුණි. | කුරුණෑගල මහා නගර සභාවේ රජපිහිල්ල තානායම බදු ලබාගත් පාර්ශවය සමඟ අදාල බදු දේපල හා අයවිය යුතු හිඟ මුදල් සම්බන්ධයෙන් අධිකරණයන්හි නඩු විභාග වෙමින් පවතී. | අයවිය යුතු මුදල නැවත ගිණුම් වලට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහා නගර සභා ආඥා පනතේ 188 වගන්තියෙන් ආවරණය නොවන කුරුණෑගල ගරු නගරාධිපතිතුමා නගරාධිපතිවරුන්ගේ ජාතික සම්මේලනයේ සභාපති වීම හේතුවෙන් පැවැත්වූ උත්සවයකට ආහාර පාන හා නවාතැන් පහසුකම් ලෙස රු.349,980 ක වියදමක් මහා නගර සභා අරමුදලින් වැයකර තිබුණි. | මෙම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාගේ ඉල්ලීම පරිදි අදාළ පහසුකම් ලබා දීම සඳහා වියදම් දැරීමට ගරු නගරාධිපතිතුමාගේ උපදෙස් පරිදි GC/06/16/ 2021/02/10/A/S2 දරණ මහා සභා සම්මුතියෙන් අනුමැතිය ලැබී ඇත. | මහා නගර සභා ආඥා පනතේ 'ක' වගන්තියේ ප්‍රතිපාදන දක්වා ඇත්තේ ප්‍රජා පිළිගැනීම හෝ පොදු වැදගත්කමකින් යුත් කටයුතු සඳහා වුවත්, එම උපදෙස් වලින් බාහිර කටයුතු සඳහා වියදම් නොකළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.759,129,083 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.348,176,000 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **2.2.1** | **වරිපනම් හා බදු**<br>2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මහා නගර සභා බල ප්‍රදේශයේ ගොඩනැගිලි 388 ක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දී ඇතත්, මෙම ගොඩනැගිලි වලින් වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගොඩනැගිලි ඉදිකිරීම් 388 ක් සඳහා අනුමැතිය ලබාගෙන ඇතත්, අනුකූලතා සහතික නිකුත් කර ඇති ගොඩනැගිලි සඳහා පමණක් වරිපනම් බදු අයකරන බව දන්වමි. | නව ඉදිකිරීම් සඳහා තක්සේරු කිරීම් සිදුකර වරිපනම් අයකළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 40 (ඊ) වගන්තියෙන් බැහැරව මධ්‍යම වෙළඳපල | * කඩ කාමර පළමු ගැණුම්කරුට ලබා දීම | * කඩ කාමර බදුදීමේ දී රජයේ තක්සේරුකරුගෙන් |

| | | | |
|---|---|---|---|
| | I, II හා III අදියර යටතේ ඉදිකරමින් පවතින කඩ කාමර 123 ක් හා මාළිගාපිටිය කඩ කාමර 12 ක් බදු දීමට කටයුතු කර තිබුණි. එසේම මෙම කඩ කාමර බදුදීමේදී එකවර අයකර ගත යුතු මුදල (key money) ප්‍රධාන තක්සේරුකරු මඟින් තක්සේරුවක් ලබාගෙන නොතිබුණු අතර 2020 ජුනි11 දින මහා සභාව තීරණය කළ ඇස්තමේන්තුවකට විනිවිද භාවයෙන් තොරව පළමු ගැනුම්කරුට බදු දීමට කටයුතු කරන බව පුවත්පත් දැන්වීමක් පලකර බදු දීමට කටයුතු කර තිබුණි. | සඳහා සභා තීරණයක් ගෙන ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගෙන ඇති බව සඳහන් කරමි.<br>* රජයේ තක්සේරුව ලැබීමට දිගු කාලයක් ගතවන බැවින් එය ලැබෙන තෙක් මහා නගර සභාවේ ආදායම් පරීක්ෂකවරුන් විසින් ලබාදෙන තාවකාලික තක්සේරුව මත බදුදීමට කටයුතු කර ඇත. | තක්සේරුවක් ලබාගත යුතු වේ.<br>* දීර්ඝ කාලීනව බදුදීම සඳහා මහා නගර සභා ආඥා පනත 40 (1) ප්‍රකාරව කඩයිම මඟින් විධිමත්ව අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුවේ.<br>* ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර විධිමත්ව බදුදීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ගරු ජනාධිපතිවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව හා රජයේ තක්සේරුවකින් තොරව මහා නගර සභාව සතු වෙලගෙදර ක්‍රීඩාංගණය, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත අවුරුදු 30ක කාලයකට දීර්ඝකාලීනව ගිවිසුම්ගතව මසකට රු.1,000 ක මුදලකට හා පවත්වන තරඟවලින් උපයන ආදායම ගෙවීමට යටත්ව බදු දීමට කටයුතු කර තිබුණි. මෙම වෙලගෙදර ක්‍රීඩාංගණය බදු දුන් 2007 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා උපයා ගෙන තිබූ ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර සභාවට ලැබිය යුතු ආදායම මහා නගර සභා අරමුදලට බැරකර නොතිබුණි. | 2021 දෙසැම්බර් 08 වන දින කුරුණෑගල මහා නගර සභාව විසින් පවත්වන ලද විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කළ පරිදි මේ පිළිබඳ කරුණු සොයා බැලීමට ක්‍රිකට් ආයතනයෙන් තොරතුරු ලබාගෙන ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. | සභාව සතු වත්කම් බදු දීමේදී අදාළ අධිකාරියේ අනුමැතිය ලබාගත යුතු වේ. වත්කම් බදු දීමට ප්‍රථම රජයේ තක්සේරුකරුගේ තක්සේරුව ලබා ගත යුතු වේ. ගිවිසුම් ප්‍රකාරව බදු අයකළ යුතු වේ. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කඩකාමර බදු දීමේ දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත මාසික බදු කුලියක් තීරණය කළ යුතු වුවද, නගර සභාව සතුව පවතින කඩකාමර 669 ක් රජයේ තක්සේරුවකින් තොරව රු.2,000 – 10,000 අතර පරාසයක් තුළ බදුදී තිබුණි. | තක්සේරුව සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර මේ වන විට වෙළඳ සංකීර්ණ 03 ක නව තක්සේරුව අප වෙත එවා ඇති අතර, මහා සභා අනුමැතිය ලබා ගෙන ඇත. | කඩ කාමරවල තක්සේරුව කාලීනව යාවත්කාලීන කර කුලිය අය කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බුවනෙක හෝටලය පිහිටි ගොඩනැගිල්ල කඩා දමා හානි සිදුකර ඒ වෙනුවෙන් නීතිඥ ගාස්තු හෝ වෙනත් වියදම් සභා අරමුදලින් ගෙවීමට ප්‍රතිපාදන නොමැති වුවත් නීතිඥ උපදේශකත්වය ලබා දීම වෙනුවෙන් රු.2,180,000 ක මුදලක්ද ගොඩනැගිල්ල කඩා දැමීමට අදාලව රිට් පෙත්සම් නඩු 05 ක් ගොනුකිරීමට රු.7,800,000 ක මුදලක් ද වැයකර තිබූ අතර මෙම නඩු සඳහා ගාස්තු ලෙස රු.1,647,500ක මුදලක් වැයකර තිබුණි. | මහා නගර සභා ආඥා පනතේ 40(ඔ) 309,310, වගන්තීන් යටතේ වන සුවිශේෂී ආරක්ෂාව නගරාධිපති ඇතුළු නිලධාරීන්ට පවතින අතර රිට් පෙත්සමට විරුද්ධව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිපතිතුමා විසින් සිදු කරන ලද අභියාචනයට ගරු නගරාධිපති ඇතුළු නිලධාරීන් සද්භාවයෙන් මහා නගර සභාව වෙනුවෙන් කටයුතු කර ඇති බැවින් ඔවුන්ව ආරක්ෂා කිරීමට පනතේ විධිවිධානයන් අනුව නීතිඥ ගාස්තු ගෙවීම නීත්‍යානුකූල වේ. | * නීති වියදම් දැරීමේ දී පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.<br>* සභාවේ දේපල වලට හානි සිදුකර ඒ වෙනුවෙන් සභා අරමුදලින් නීතිඥ ගාස්තු වියදම් දැරීමට ප්‍රතිපාදන සලසා නැත. |

## 3.5 දෘශ්‍ය අක්‍රමිකතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 3.5.1 | නාගරික සංවර්ධන අධිකාරියේ හා මහා නගර සභා සැලසුම් කමිටුවේ අනුමැතියකින් තොරව කුරුණෑගල බස් නැවතුම්පොළෙහි මගී ජනතාවට පහසුවෙන් රැඳී සිටීමට වෙන්කර ඇති හිස් අවකාශවල කඩ කාමර 31 ක් ඉදිකර තිබුණි. මින් කඩ කාමර 18 ක් බදුකරුට ඉදිකිරීමට අවස්ථාව ලබා දී තිබූ අතර, කඩ කාමර 13 ක් ඉදි කිරීමට රු.18,112,211 ක වියදමක් සභා අරමුදලින් දරා තිබුණි. තවද ටෙන්ඩර් ක්‍රමවේදයකින් බැහැරව, රජයේ තක්සේරුවකින් හා ගරු ජනාධිපතිතුමාගේ අනුමැතියකින් තොරව අවිධිමත්ව තෝරාගත් පුද්ගලයින්ට බදු දී තිබුණි. | * පෞද්ගලික ආයෝජකයින් විසින් කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් ගරු නගරාධිපතිතුමා විසින් ඊට අදාල නාම ලේඛණය මහා සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.<br>* මහා නගර සභා ආඥා පනතේ 229 වගන්තිය ප්‍රකාරව නාගරික කොමසාරිස් සතු ප්‍රසම්පාදනය සම්බන්ධ බලතල යටතේ ටෙන්ඩර් මණ්ඩලයද මහා සභාව වන බැවින් මහා සභාව තීරණය කරන අන් ආකාරයක් අනුගමනය කිරීම සිදුකර ඇත. | * ඉදිකිරීම් සිදු කිරීමේ දී සැලසුම් අනුමත කරගත යුතු වේ.<br>* කඩ බදුදීමේ දී ප්‍රධාන තක්සේරුකරු ලවා තක්සේරු කරවාගෙන බදු හා එකවර ගෙවිය යුතු මුදල් අයකළ යුතු වේ.<br>* රජයේ ඉඩම් හා ගොඩනැගිලි බදු දීමේදී ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතු වේ.<br>* මෙම අක්‍රමිකතාවයට අදාල නිලධාරින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| 3.5.2 | මහා නගර සභාව හා රජය සතු ඉහළ වාණිජ වටිනාකමක් සහිත පර්චස් 55.48 ක ප්‍රමාණයක ඉඩම් කොටස් 08 ක් මහා නගර සභා ආඥා පනතේ 40 (1) ඊ විධිවිධාන වලින් බැහැරව අවිධිමත් ටෙන්ඩර් ක්‍රමවේදයක් භාවිතා කර පෞද්ගලික පාර්ශවයක් වෙත බදු දී තිබුණි. මෙම ඉඩම් බදු දීමේදී රජයේ තක්සේරුකරුගේ තක්සේරුවකින් තොරව සිදුකර තිබුණි. | * සභා සම්මුතියකට අනුකූලව එකී ඉඩම් කාර්යක්ෂමව භාවිතා කිරීමෙන් ඉඩම් බදුදීම සිදුකර ඇති වුවද, විධිමත් පැවරුම් නියෝග නොමැති බව සඳහන් කරමි.<br>* මෙම ඉඩම් ටෙන්ඩර් පරිපාටියක් අනුගමනය කිරීම හෝ සභාව තීරණය කරන ප්‍රසිද්ධ වෙන්දේසියේ නොවන අන් ආකාරයකින් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව බදුදීම/ විකිණීම මහා නගර සභාව විසින් සිදුකළ හැකි බැවින් ඒ අනුව මෙම ඉඩම් බදුදීම සිදුකර ඇත.<br>* රජයේ තක්සේරුව ලැබීමට දිගු කාලයක් ගතවන බැවින් එය ලැබෙන තෙක් මහා නගර සභාවේ ආදායම් පරීක්ෂකවරුන් විසින් ලබාදෙන තාවකාලික තක්සේරුව මත බදුදීමට කටයුතු කර ඇත. | * මහා නගර සභාවට පැවරුම් නියෝගයක් මඟින් ලබා දී ඇති ඉඩම් ජනාධිපති අනුමැතිය නොමැතිව පැවරීම නොකළ යුතු වේ.<br>* ඉඩම් බදු දීමට පෙර රජයේ තක්සේරුව ලබාගත යුතු වේ.<br>* මහා නගර සභාවේ ප්‍රයෝජනයට අනවශ්‍ය ඉඩම් විධිමත්ව ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර බදු දිය යුතු වේ. |
| 3.5.3 | සභාවේ අවශ්‍යතාවය සඳහා එක්ස්කැවේටර් යන්ත්‍රයක් කුලියට ගැනීමේදී මිල ගණන් ඉදිරිපත් කල ආයතන 3 න් 2 ක්ම ව්‍යාජ ආයතන බැවින් තරඟකාරීත්වයකින් තොරව මෙම සේවාව ලබාගෙන 2020 ජුනි සිට 2021 දෙසැම්බර් රු.17,943,500ක මුදලක් ගෙවා තිබුණි. සභාව සතු එක්ස්කැවේටර් යන්ත්‍රය අලුත්වැඩියාව එස්කැවේටර් යන්ත්‍රය කුලියට ගත් ආයතනයෙන්ම සිදු කිරීමට කටයුතු කිරීම හේතුවෙන් එම යන්ත්‍රය අලුත්වැඩියාව නොකර දීර්ඝකාලීනව කුලී ගෙවමින් පැවතුණි. | නාගරික කොමසාරිස් සීමිත මිල ගණන් කැඳවා තාවකාලික සේවය ලබා ගැනීමට දුන් අනුමැතිය අනුව නාගරික ඉංජිනේරු නිර්දේශය මත සීමිත මිල ගණන් යටතේ තාවකාලික කුලී පදනම මත සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත. | * ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කිරීමේ දී විනිවිදභාවයකින් දූෂ්‍ය ක්‍රියාවලියකින් යුතුව සිදුකළ යුතු වේ.<br>* මහා නගර සභාව සතු යන්ත්‍ර අලුත්වැඩියාව සිදුකර භාවිතයට ගැනීමටත් අනවශ්‍ය වියදම් අවම කිරීමටත් කටයුතු කළ යුතු වේ.<br>* මේ සම්බන්ධව වගකිව යුතු නිලධාරින්ට අදාලව ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| 3.5.4 | වැව රවුම පරිශ්‍ර භූමිය විනෝදාත්මක කටයුතු සඳහා වසර 15 කට බදු දීමේදී රජයේ තක්සේරුව ලබා නොගෙන ගරු ජනාධිපතිතුමාගේ අනුමැතියකින් තොරව ව්‍යාජ ආයතනයක මිල ගණන් හා නගර සභාවේ සම්බන්ධතා පවත්වන්නකුගේ මිල ගණන් ලබාගෙන තරඟකාරීත්වයකින් තොරව බදු දීමට කටයුතු කර තිබුණි. | ආයතන 2 කින් මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර, 2019 සැප්තැම්බර් 03 දින ටෙන්ඩරය අනුව තාක්ෂණික ඇගයීම මත වැඩිම මිල ඉදිරිපත් කළ ආයතනය වෙත පිරිනැමීම අනුමත කර වසර 15කට බදු දී ඇත. | * මහා නගර සභාව සතු වත්කම් බදුදීමේ දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලබාගෙන මිල තීරණය කළ යුතු වේ.<br>* මහා නගර සභාව සතු ඉඩමක් බදු දීමට ගරු ජනාධිපති අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.<br>* විනිවිදභාවයකින් යුතුව ටෙන්ඩර් ක්‍රමය අනුගමනය කර බදුදිය යුතු වේ. |

**3.6 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 3.6.1 | මහා නගර සභාවෙන් පිටත ජල සම්බන්ධතා ලබාදීම සඳහා රු.25,862,363 ක මුදලක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමේදී ජල මීටර්වල හා කොන්ක්‍රීට් කණුවල මිල ගණන් කැඳවා අවම මිල ගණන් ලබාගෙන ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු අතර, අධි ඇස්තමේන්තු පිළියෙල කර රු.1,889,895 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීම් හා පරීක්ෂා කිරීම් සිදුකල නිලධාරීන්ගේ අත්සන හා නිලමුද්‍රාවත්, අනුමත කිරීමේදී නාගරික ඉංජිනේරු නිල මුද්‍රාවත් යෙදීම අතපසු වී ඇත. එම කටයුතු ඉදිරියේදී නිවැරදි කර ගැනීමට පියවර ගන්නා බව සඳහන් කරමි. | * ප්‍රසම්පාදන කටයුතු ඇරඹීමට ප්‍රථම පිරිවැය ඇස්තමේන්තුවක් විධිමත්ව සකස් කර අදාළ අධිකාරියේ අනුමැතිය ලබා ගත යුතු වේ.<br>* පිරිවැය ඇස්තමේන්තුව සැකසීමේදී වෙළඳපල මිල ගණන් ලබාගෙන ඇස්තමේන්තුව සැකසිය යුතු වේ.<br>* තාක්ෂණික නිලධාරීන් අදාළ වැඩ විෂයයන් පරීක්ෂා කිරීමෙන් පසු ගෙවීම් කළ යුතු වේ. |
| 3.6.2 | සභාව විසින් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා 2019, 2020 හා 2021 වර්ෂවල රු.11,155,000 ක් වටිනා ජලමනු 5,000 ක් මිලදීගෙන තිබුණි.<br>* 2022 ජනවාරි 12 දින විගණනය විසින් නගර සභාව ජල මීටර මිලදීගත් ආයතනයෙන්ම ලබාගත් මිල ගණන් අනුව MEN වර්ගයේ ½ ” ජලමනුවක් රු.3,975 ක් වූ අතර 2019 අගෝස්තු 2 දින නගර | * නගර සභාව මඟින් මෙම ජල මීටර් මිලදී ගෙන ඇත්තේ වෙළඳපොලෙහි 2019 වර්ෂයේදී පැවති මිල ගණන් ප්‍රකාරව බව සඳහන් කරමි.<br>* වෙළඳපල මිල ගණන් ප්‍රකාරව මෙම මිලදී ගැනීම සිදු කර ඇති බවත් ඒ බව මෙම ටෙන්ඩරය සඳහා ඉදිරිපත් කළ මිල ගණන් මඟින් තහවුරු වන බවත් සඳහන් කරමි. | * නීති, රීති අනුව සැපයුම්කරුවන් ලියාපදිංචි කර විධිමත්ව ලේඛනගත කළ යුතු වේ.<br>* මහා නගර සභාවට උපරිම වාසි ලැබෙන පරිදි අවම මිලට මිලදී ගැනීම් සිදු කිරීමට හැමවිටම කටයුතු කළ යුතු වේ.<br>* වංචනික හා අක්‍රමිකතා මගහරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | සභාව විසින් මිලදීගෙන තිබූ එම වර්ගයේ ජල මීටරයක මිල රු.4,350 කි. ඒ අනුව 1,125,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.<br><br>* 2020 වර්ෂයේ ජලමීටර් 1,000 ක් මිලදී ගැනීමේදී අඩු මිලක් ඉදිරිපත් කර තිබූ ආයතනයේ රු.4,000 ක මිල ප්‍රතික්ෂේප කර රු.4,350 කට මිලදී ගැනීම හේතුවෙන් සභාව විසින් රු.350,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.<br><br>* 2021 වර්ෂයේ අඟල් ½ ජල මීටර් 1,000 ක් මිලදීගත් ආයතනයෙන් විගණනය විසින් ලබාගත් මිල ගණන් අනුව මිලදීගෙන තිබූ Baylan වර්ගයට අයත් තුර්කියේ නිෂ්පාදිත පිත්තල වර්ගයේ අඟල් 1/2 ජල මීටරයක මිල රු.4,482 කි. ඒ අනුව වෙළඳපොළ පවතින මිලට වඩා වැඩි මිලක් වන රු.5,500 කට ජල මීටර් 1,000 මිලදී ගැනීම සඳහා රු.1,018,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | | * සාමාන්‍ය වෙළඳපල තුළ මිල ගණන්වැඩි වන බැවින් 2019 ට සාපේක්ෂව 2022 මිල වැඩි වේ. 2022 ට වඩා වැඩි මිලකට 2019 වර්ෂයේදී මිලදී ගැනීම අසාමාන්‍ය තත්ත්වයකි. |
| 3.6.3 | ගරු නගරාධිපති නිල නිවස සඳහා රු.4,992,000 ක් වටිනා ලී බඩු උපකරණ මිලදී ගැනීම සිදුකර තිබුණේ තිරරෙදි මැසීම සිදුකරන ආයතනයකින් බවත් මෙම සැපයුම්කරු උප බදු දීම මඟින් නිල නිවසට ලී බඩු උපකරණ සපයා තිබුණි. මෙම ලී බඩු උපකරණ 2021 දෙසැම්බර් 15 දින වන විට ගබඩාවට භාරදීමට කටයුතු කල යුතු වුවද, 2021 දෙසැම්බර් 01 සිට 2022 අප්‍රේල් 06 දක්වා සැපයීම ප්‍රමාද කර සැපයුම්කරු ඉදිරිපත් කළ ටෙන්ඩරයේ සඳහන් මිලට වඩා වැඩියෙන් රු.875,000 ක මුදලක් ගෙවීම්කර තිබුණි. | මෙම ප්‍රසම්පාදනය "නගරාධිපති නිල නිවසට ගෘහ උපකරණ මිලදී ගැනීම" සඳහා පැවැත් වූ අතර එය ගෘහ භාණ්ඩ<br>අදාළ කාල සීමාවේදී රටෙහි පැවති උද්ධමනකාරී වාතාවරණයක් තුළ හා රටෙහි පැවති කොරෝනා වසංගත තත්ත්වය තුළ සිදුවූ කාල ප්‍රමාදය හේතු කොට ගෙන මෙම අමතර පිරිවැය (සියයට 20) දැරීමට සිදුවී ඇත. | * ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයකින් සිදුකළ යුතු වේ.<br><br>* ගිවිසුම් කාලය තුළ භාණ්ඩ සපයා නිමකළ යුතු අතර අමතර ගෙවූ මුදල් පරීක්ෂණ පවත්වා අයකර ගත යුතු වේ.<br><br>* අතරමැදියන් මාර්ගයෙන් උපකරණ මිලදී ගැනීමේ දී ඉහල මිලක් ගෙවීමට සිදුවීමෙන් සිදුවන පාඩුව අවම කළ යුතු වේ. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|---|
| 3.7.1 | 2018 වර්ෂයේ මහා නගර සභා අරමුදල් මඟින් ඉලුප්පුගෙදර මාර්ගයේ ජලනල එළීම සඳහා 2019 ජූලි 22 දින රු.6,698,066 මුදලකට වැඩ නිමකර තිබුණි. අවම මිල ප්‍රතික්ෂේප කර කර්මාන්තය ලබාදීම සුදුසු බව නිර්දේශ කර තිබියදී රු.6,138,164 ක් වූ වැඩිම මිලට ටෙන්ඩරය පිරිනැමීමට මුදල් පිළිබඳ ස්ථාවර කමිටු නිර්දේශය මහා සභාව අනුමත කර තිබීම හේතුවෙන් රු.710,699ක් සභා අරමුදලට පාඩු සිදුකර තිබුණි.<br><br>* මෙම ව්‍යාපෘති කාලය තුළ වෙළඳපොළ පවතින මිල ගණන් අනුව මිලි මීටර 90 PNT 11 ප්‍රමාණයේ PVC බට මීටරයක මිල (ලාභාන්තිකය සමඟ) රු.1,903 ක් වේ. ඒ අනුව මීටරයක් රු.2,467 බැගින් ඇස්තමේන්තු කිරීම හේතුවෙන් මීටරයකට රු.564 බැගින් මීටර් 1,700 කට රු.958,805 ක් වැඩිපුර ඇස්තමේන්තු කර තිබුණි. ලංසුකරු විසින් විෂයය අංක 5 යටතේ අගල් 3 PVC නල සඳහා මීටරයකට රු.2,778.28 ක මිලක් ඉදිරිපත් කර තිබූ බැවින් රු.1,504,500 වැඩිපුර ගෙවා තිබුණි.<br><br>* ඉලුප්පුගෙදර මාර්ගය කාපට් කරන බව 2018 සැප්තැම්බර් 27 දින මෙම ඇස්තමේන්තු පිළියෙල කිරීමේදි දැනගෙන සිටියදීත්, ඒ අවශ්‍යතාවයට ගැළපෙන ලෙස ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් නැවත පස් ඉවත් කිරීම හා අදාල වියදම් සඳහා දරා තිබූ රු.760,797 ක මුදල නිෂ්කාර්යය වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.<br><br>* වැඩ විෂයය අංක 03 අනුව 0-1500 ප්‍රමාණයේ ගැඹුරට පස් කැපීම සඳහා BSR B7 අනුව සන සන මීටරයක් රු.1,152 බැගින් මීටර් 577.50 කට රු.665,280 ඇස්තමේන්තු කර තිබුණි. එසේ වුවත් මෙම වැඩ විෂයය යන්ත්‍ර මඟින් සිදුකර සත්‍ය මිල අනුපාතය සන මීටරයක් සඳහා | * අදාළ ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීමේ අවශ්‍යතාවය මත ඉලුප්පුගෙදර මාර්ගයෙහි ජලනල එළීම් කටයුතු වැඩිම මිල ඉදිරිපත් කළ ආයතනයකට මහා සභා අනුමැතිය මත පිරිනමා ඇත.<br><br>* ඇස්තමේන්තු වැඩ විෂය අංක 5 යටතේ රු.2,467.50 ක් ලෙස දක්වා ඇත්තේ 3'' PVC නලයක වෙළඳපල වටිනාකම නොව එය මිළදී ගැනීම, ස්ථානයට උචිත පරිදි සැරහුම් කිරීම ඇතුලු කාරණා සඳහා වූ මිල වේ.<br><br>ඉලුප්පුගෙදර මාර්ගයේ ජලනල එලීමට ඇස්තමේන්තු කරන විට ඉලුප්පුගෙදර මාර්ගය කාපට් කිරීමේ වැඩ ආරම්භකර තිබූ අතර, ඒ පිළිබඳව තාක්ෂණ නිලධාරි දැන සිටි අතර, එවකට එම ස්ථානයට උචිත පරිදි ඉංජිනේරු උපදෙස් වලට අනුගතව ඇස්තමේන්තු සකස් කරන ලදී. | * ඇස්තමේන්තු සිදුකර ඇත්තේ PVC බට සඳහා පමණක් නම් ඒ අනුව ගෙවීම් කළ යුතු වේ.<br>* ප්‍රමාණ පත්‍ර හා බිල්පත් මත තාක්ෂණික නිලධාරියාගේ සහතිකය මත ගෙවීම් කළ යුතු වේ.<br>* පරීක්ෂණ පවත්වා සභා අරමුදලට සිදුකර ඇති අලාභ අයකරගත යුතු වේ.<br><br>* ප්‍රසම්පාදන නීති,රීති අනුව ප්‍රසම්පාදන කටයුතු කළ යුතු වේ.<br><br>* සැලසුම් සහගතව කටයුතු කිරීමෙන් නිෂ්කාර්යය වියදම් වළක්වා ගත යුතු වේ.<br><br>* පරීක්ෂණ පවත්වා මහා නගර සභා අරමුදලට සිදු වී ඇති අලාභ අයකරගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | රු.196.60 ක් බැවින් ඝන මීටරයකට රු.955.40 බැගින් ඝන මීටර් 577.50 කට රු.551,743 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | | |
| 3.7.2 | 2021 වර්ෂයේ මහා නගර සහා ප්‍රතිපාදන මත සුන්දරාපොළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ අලුත්වැඩියා කටයුතු සඳහා රු.2,610,983 ක මුදලකට ගිවිසුම්ගත වී තිබුණි. මෙම ව්‍යාපෘතිය නොවැම්බර් 22 නිමකල යුතු වුවත්, 2022 පෙබරවාරි 22 දක්වා ව්‍යාපෘතිය දීර්ඝ කර තිබුණද, 2022 ජනවාරි 31 දින ව්‍යාපෘතිය පරීක්ෂාවේ දී, රු.713,787 ක් වටිනා වැඩ විෂයයන් 07 ක් පමණක් ඉටුකර තිබුණි. ගිවිසුම්ගත වී එකඟ වූ වටිනාකමෙන් තවදුරටත් සිදු නොකල උඩුමහළ ඉදිකිරීම හා වැසිකිළි ඉදිකිරීමට අදාළව අයිතම 38 ක නිම නොකළ වැඩවල වටිනාකම රු.2,203,452ක් වූ අතර එය ඇස්තමේන්තුගත වටිනාකමෙන් සියයට 48ක ප්‍රතිශතයක් විය. | මෙම ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා යම් යම් අවස්ථාවලදී කාලය දීර්ඝ කර තිබුණද කොන්ත්‍රාත් ආයතනය මගින් මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේදී අඩුපාඩු සිදුව ඇති බව පෙනී ගිය හෙයින් මෙම වැඩ විෂයය මේ වන විට අධිභාර කිරීමට කටයුතු කර ඇත. | * ගිවිසුම්ගත කාලය තුල ව්‍යාපෘතිය නිමකළ යුතු වේ.<br>* කොන්ත්‍රාත්කරු අකාර්යක්ෂමව කටයුතු කර ඇත්නම් නැවත කර්මාන්ත ඉටු කිරීමට අවස්ථාව නොදී අසාධු ලේඛනගත කළ යුතු වේ. |
| 3.7.3 | 2021 වර්ෂයේ පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සුන්දරාපොළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.10,450,462 ක බිල්පතක් ඉදිරිපත් කර තිබුණි.<br>* ප්‍රමාණ පත්‍රය හා බිල්පත අනුව C.10 හා C.24 අයිතම සම්පූර්ණයෙන්ම ඉටු කර නොතිබියදී රු.241,592 ක මුදලක් ගෙවා තිබුණි. අයිතම අංක 3.7 අනුව අත්තිවාරම පස් යොදා පිරවීම සඳහා රු.188,428 ක් ගෙවීමට ඉදිරිපත් කළද මෙම වැඩයද සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණි. Tie Beams කුළුණු යොදා නොතිබුණද මේ සඳහා කම්බි යොදා ඇති බව දක්වා කම්බි 1815.94 kg ක් සඳහා රු.687,365 ක් ගෙවීම් කර තිබුණි. | පළාත් සභා අමාත්‍යාංශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානයේ උපදේශක ඉංජිනේරුතුමාගේ කරුණු විමසා වාචිකව ලැබුණු උපදෙස් අනුව ප්‍රතිපාදන ආපසු නොයන ලෙසට බිල්පත් සකස් කොට ඉදිරිපත් කරන ලදි. | * නොකළ වැඩ වෙනුවෙන් හා ව්‍යාජ බිල්පත් සකස් නොකළ යුතු වේ.<br>* ගිවිසුම්ගත කාලයට ව්‍යාපෘති ඉටු කරවාගෙන මුදල් ප්‍රතිපූර්ණ කරගත යුතු වේ. |
| 3.7.4 | පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සුන්දරාපොළ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ මළ අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා නිර්මාණය හා ඉදිකිරීම ක්‍රමය (Design & Build) යටතේ ඉදිකිරීමට 2021 ඔක්තෝබර් 22 දින කොන්ත්‍රාත් | * ගිවිසුම් ප්‍රකාරව අදාළ කොන්ත්‍රාත් ආයතනය විසින් කොන්ත්‍රාත්තුවට අදාළ අයිතමයන් මිලදී ගැනීම සිදු කර එයට අදාල යන්ත්‍ර පැය සමග වාර්තාවක් ඉදිරිපත් කර | * ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කොන්ත්‍රාත් ක්‍රමය තෝරා ගැනීම සිදු කළ යුතු වේ.<br>* නිෂ්කාර්යය ලෙස |

| | | | |
|---|---|---|---|
| | ආයතනයක් සමඟ රු.49,500,000 ක මුදලකට ගිවිසුම් ගත වී රු.9,635,093 ක මුදලක් ගෙවීම්කර තිබුණි. එක් ලංසුවක් පමණක් ඇගයීම් කිරීම හේතුවෙන් තාක්ෂණික හා මූල්‍ය හැකියාවක් හා රජයට වඩා අරපිරිමැස්මෙන් යුතු ව්‍යාපෘතියක් තෝරාගත හැකි අවස්ථාව අහිමි වී ඇත.<br><br>* ටැංකි 04 ක් ඉදිකිරීම සඳහා මීටර් 15ක් දිග, මීටර් 9 ක් පළල හා මීටර් 2.84 ක් ගැඹුරු වලක් පමණක් හාරා ඒ සඳහා මිනුම්පතක් ඉදිරිපත් කර නොතිබියදී රු.2,597,000 ක මුදලක් ද රු.9,635,093 වටිනාකම වූ යන්ත්‍ර උපකරණ සුන්දරාපොළ පරිශ්‍රයේ දමා තිබූ අතර එම උපකරණ සඳහා මුදල් ගෙවා ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | තිබුණි.<br><br>* කොවිඩ් වසංගතය, අයහපත් කාලගුණය හා අමුද්‍රව්‍ය හිඟවීම හේතුවෙන් ජනවාරි මස 22 වන දින සිට දින 50ක කාලයක් දීර්ඝ කර ඇත. නියමිත කාලරාමුව තුළ අවසන් කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතිය සඳහා මිලදීගත් උපාංග වැඩ බිමෙහි ගබඩා කර රජයේ මුදල් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් නොකළ යුතු වේ.<br><br>* ගිවිසුම්ගත කාලය තුල ව්‍යාපෘති නිම කර ගැනීමට වගකිව යුතු නිලධාරින් කටයුතු කර ගෙවීම් කළ යුතු වේ. |
| 3.7.5 | 2018 වර්ෂයේ මහා නගර සභා ප්‍රතිපාදන මත මාළිගාපිටිය ක්‍රීඩාංගණය ජාත්‍යන්තර මට්ටමින් සංවර්ධනය සඳහා රු.53,383,790ක ඇස්තමේන්තුවක් සකස් කර කොන්ත්‍රාත්කාර ආයතනයක් සමඟ රු.53,330,591ක මුදලකට ගිවිසුම්ගතව රු.46,470,733 ක මුදලක් ගෙවීම්කර තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාල ලිපිගොනු හා භෞතික පරීක්ෂාවේ දී රු.46,936,580ක අවම ලංසුකරු ප්‍රතික්ෂේප කර රු.53,330,591 ක ලංසුව ඉදිරිපත් කල ආයතනයට ටෙන්ඩරය පිරිනමා තිබීමෙන් රු.6,394,011 ක පාඩුවක් සභා අරමුදලට සිදුවී තිබුණි.<br><br>* පස් ඝන මීටරයක් යන්ත්‍ර සූත්‍ර භාවිතා කර කැපීම සඳහා සම්මත මිල රේටයන් අනුව රු.198 ක් වුවත්, මෙම ව්‍යාපෘතියේ පස් කැපීම සඳහා ඝන මීටරයකට රු.800 බැගින් ගෙවීම හේතුවෙන් ඝන මීටර් 1518.62 ක් කැපීම සඳහා රු.602 ක බැගින් රු.914,209ක් වැඩිපුර ගෙවා තිබුණි.<br><br>* ඉංජිනේරු ඇස්තමේන්තුව මඟින් ක්‍රීඩාංගණයේ තණකොළ සිටුවීම සඳහා සකස් කළ රු.8,641,200ක ඇස්තමේන්තුව ඉවත් කර අතිරේක වැඩ විෂයයක් ලෙස රු.24,535,000 ක වියදමක් දරා තිබූ අතර, එය ඇස්තමේන්තු වියදමට වඩා රු.15,893,800 ක් වැඩිවී තිබුණි. මෙම වැඩ විෂයය කොන්ත්‍රාත් ආයතනය විසින් වෙනත් ආයතනයකට උප කොන්ත්‍රාත් | තණකොළ සිටුවීම සඳහා සැලසුම් කළ වැඩ විෂයයේ විෂය පථය සංශෝධනය වීම නිසා ඒ සඳහා නව ඒකක මිලක් තීරණය කල යුතු විය. ක්‍රීඩා පිටියේ තණකොළ සිටුවීම සඳහා මිල විශ්ලේෂණය යටතේ නීත්‍යානුකූල කොන්ත්‍රාත්කාර ආයතනය සමඟ එකඟවිය. ඒ සඳහා ඒ සඳහා එම ආයතනය මඟින් ක්‍රීඩාපිටියේ තණකොළ වැවීම සඳහා අත්දැකීම් ඇති ආයතනයක් යටතේ සිදු කිරීමට කටයුතු කරන ලදී | * ඇස්තමේන්තු නිසි පරිදි සැකසීමට කටයුතු කළයුතු වේ.<br><br>* ඇස්තමේන්තු ප්‍රමාණය ඉක්මවා ගෙවීම් කිරීමේ දී ඒ සඳහා අනුමැතිය ලබාගෙන හා සත්‍ය මිනුම්පත් මත ගෙවීම් කළ යුතු වේ.<br><br>* පස් කැපීම සිදුකළ ආකාරය අනුව මිල රේටයන් මත ගෙවීම් සිදුකළ යුතු වේ.<br><br>* අතිරේක වැඩ ඇස්තමේන්තුවේ වටිනාකමින් සියයට 10ක පමණ පරාසයක් තුල සිදුකළ යුතු වේ. කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 45 ක ප්‍රමාණයක් බැවින් නගර සභාව ඍජුව කොන්ත්‍රාත් ලබා දිය යුතු මෙම වැඩ විෂයය උප කොන්ත්‍රාත් ලබාදීම නොකළ යුතු වේ. |

ලබාදීමක් සිදුකර තිබූ අතර මේ තරම් අධික මුදලක් සෘජුව නගර සභාව විසින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර ලබාදී නොතිබීම හේතුවෙන් ගුණාත්මයෙන් යුතු තණකොළ නොමැති වීම මත ගැටළු මතුවී ඇති බවද විගණනයට නිරීක්ෂණය විය.

3.7.6 කුරුණෑගල මහා නගර සභාව සතු මධ්‍යම වෙළඳපල I හා II අදියර දෙක සඳහාම එක් ආයතනයක් සමඟ ගිවිසුම්ගතව I වන අදියර ව්‍යාපෘතිය රු.948,518,334 කටද II අදියර රු.1,231,001,682 ක මුදලකටද ගිවිසුම්ගතව ව්‍යාපෘතිය ඉදිකරමින් පැවතුණු අතර I වන අදියර රු.493,501,792 ක් හා II වන අදියර රු.1,420,353,223 ක් ගෙවීම් කර තිබුණි.

* පළමු අදියර ඉදිකිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:3:2 වගන්තිය ප්‍රකාර පුවත්පත් දැන්වීමේ වැඩ විෂයය ප්‍රධාන සංරචක දක්වා නොතිබුණි.

* පළමු අදියරේ ලංසුකරුවන් දෙදෙනාම ප්‍රසම්පාදන ලියවිලි ලබාගෙන තිබුණේ 2019 සැප්තැම්බර් 08 එකම දිනය තුලදී බවත් සැපයුම්කරුවන් ලංසු තැන්පත් මුදල ගෙවා තිබුණේ 2019 සැප්තැම්බර් 08 දින එක් වේලාවක් තුල බව නිරීක්ෂණය විය. මේ අනුව ප්‍රසම්පාදනයේ ආචාරධර්ම ඉටුවීම පිළිබඳව විගණනයේදී ගැටළු සහගත බවක් නිරීක්ෂණය විය. ලංසු දෙකේම අකුරු, ඉලක්කම් සමාන අවස්ථා නිරීක්ෂණය විය.

* ඇස්තමේන්තු පරීක්ෂාව සඳහා කමිටුව පත්කිරීමේ මූලික ඉලක්කය වී තිබුණේ විශාල විචලනයන් අධ්‍යයනය කොට වාර්තාවක් ලබාදීම වුවත් මෙම විචලන පිළිබඳ ප්‍රමාණවත් පරිදි අධ්‍යයනයක් සිදුකර වාර්තාවක් ලබාදී නොතිබුණි. මෙම කමිටුව විසින් අයිතමයන් 02 ක මිල රු.68,392,500 සිට රු.226,000,000 දක්වා වැඩිකර තිබුණි.

* II අදියරේ ඉදිරිපත් කල ලංසු පරීක්ෂාවේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 ප්‍රකාරව විස්තරාත්මකව ලංසු ඇගයීම කලයුතු වුවත් අයිතම 142 ක ඉංජිනේරු

* ප්‍රසම්පාදන දැන්වීමක ඇතුලත් වීමට සුදුසු යැයි යෝජනා කරනු ලබන කරුණු වලට අදාලව මෙම ව්‍යාපෘතියෙහි ප්‍රසම්පාදන ඒකකය විසින් තීරණය කරන ලද කරුණු ඇතුලත් කර මෙම ප්‍රසම්පාදන දැන්වීම සකස් කර ඇත.

* කුරුණෑගල මහා නගර සභාව විසින් සංශෝධිත ඇස්තමේන්තු සකස් කර වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා යොමුකර ඇති අතර, ඉන් පසුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී.

* ඇස්තමේන්තු මුදලට වඩා සියයට 40 ක පමණ විචලනයක් පවතින බැවින් නැවත ප්‍රසම්පාදනයට කටයුතු කළ යුතු වේ.

* ඇස්තමේන්තු විචලන සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර ඇස්තමේන්තු මුදලට එකඟකරවා ගත යුතු වේ.

ඇස්තමේන්තුවට වඩා සියයට 19 සිට 659 දක්වා විචලනයක් සහිතව රු.85,348,311 වැඩිපුර මුදලකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ බව නිරීක්ෂණය විය.